# රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

**பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு**

**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government**

**නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.**

**சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை.**

**Independence Square, Colombo 07, Sri Lanka.**


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | CS/SLAS/GR.I POSTING | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2023.02.21 |

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 02/2022 හි විධිවිධාන ක්‍රියාත්මක කිරීම</u>**

උක්ත සඳහන් චක්‍රලේඛයෙහි විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක: PSC/PRO/7/1898/2022 හා 2023.02.09 දිනැති ලිපියෙන් පහත තීරණ ලබා දී ඇති බව කාරුණිකව දන්වමි.

I. 2023.01.05 දිනැති අංක 20 දරන මැතිවරණ කොමිෂන් සභා චක්‍රලේඛයෙහි 09.(i) ඡේදයෙහි දක්වා ඇති විධිවිධාන සැලකිල්ලට ගෙන, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2022 අනුව දීප ව්‍යාප්ත සේවාවන්හි විධායක සේවා ගණයේ I ශ්‍රේණියේ තනතුරුවලට පත් කිරීම සඳහා පැවැත්වීමට නියමිත සම්මුඛ පරීක්ෂණ නියමිත පරිදි පැවැත්වීමට හා එම සම්මුඛ පරීක්ෂණයෙහි ප්‍රතිඵල මත සිදු කරනු ලබන පත්කිරීම් 2023.03.20 දින දක්වා කල් තැබීමට

II. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2022 හි දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව දීප ව්‍යාප්ත සේවාවල විධායක සේවා ගණයේ I ශ්‍රේණියේ තනතුරුවලට පත් කිරීමේ ක්‍රියාවලියට ගතවන කාල සීමාවද සලකා බලා , එම I ශ්‍රේණියේ තනතුරුවලට පත් කිරීම් කිරීමට අදාළ ලකුණු පටිපාටිය සහිත අයදුම්පත් කැඳවීමේ නිවේදනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විධිමත් අනුමැතියක් ලබා ගැනීම සඳහා 2023.02.28 දිනට පෙර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට යටත්ව මේ වන විට එම I ශ්‍රේණියේ තනතුරුවල පූර්ණ කාලීනව රාජකාරි ඉටු කිරීමේ පදනම මත පත් කර ඇති කාල සීමාව 2023.04.30 දින දක්වා දීර්ඝ කිරීමට

III. එම 2023.04.30 දින දක්වා පූර්ණ කාලීන රාජකාරි ඉටු කිරීමේ පදනම මත තනතුරුවලට පත් කිරීමේ කාලය දීර්ඝ කර ගැනීම සඳහා නිසි පරිදි සම්පූර්ණ කරන ලද EST ආකෘතිපත්‍ර අදාළ වන සියළුම ලිපිලේඛන මෙම අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ ද සමඟ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියට ඉදිරිපත් කරන ලෙස දැන්වීමට

IV. 2010 වසරේ ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගන්නා ලද, 2022.12.31 දිනට පෙර ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියට උසස් කිරීමට සුදුසුකම් ලබන නිලධාරීන් මේ වන විට පූර්ණ කාලීනව රාජකාරි ඉටු කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විධිමත් පරිදි පත් කර ඇත්නම් එකී I ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු ලෙස සලකා බැලීම අවශ්‍ය නොවන බවට.


කේ.ඩී.එන්. රංජිත් අසෝක
අතිරේක ලේකම් (රාජ්‍ය පරිපාලන)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට

දුරකතන : 0112-698605
ෆැක්ස් : 0112-683651
විද්‍යුත් ලිපිනය : pubad.dslas@gmail.com